**Sawani Rajakaruna**
Attorney-at-Law, Notary Public
& Commissioner for Oaths

No. 365, Rajagiriya Road, Rajagiriya, Sri Lanka
Tel: 0711911711/0755955375
E-mail: rajakaruna.sawani@gmail.com

ලියාපදිංචි තැපැලෙනි

නීතිඥ සම්පත් යාලෙවත්ත,
අංක 192, හල්ෆ්ට්ස්ඩොෆ් වීදිය,
කොළඹ 12.

වර්ෂ 2026ක් වූ ජනවාරි මස 17 වැනි දින දී ය.

මහත්මයාණනි,

<u>පිළිතුරු ලිපිය - ඔබගේ 2025-12-27 දිනැති එන්තරවාසියට පිළිතුර</u>

1. ඔබගේ සේවාදායකයා වන පන්නිපිටිය, රුක්මලේ, බාලිකා නිවාස පාර, දෙල්ගහවත්ත, අංක 157/1/2 දරන ලිපිනයෙහි පදිංචි වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතාගේ උපදෙස් මත මාගේ සේවාදායකයා වන පිළියන්දල, ගොරකපිටිය, ඇළ පහළ පාර, අංක 66/ඒ හි පදිංචි කේ. ඩබ්. ඒ. ධර්මශ්‍රී කාරියවසම් යන අයට එවන ලද 2025-12-27 දිනැති එන්තරවාසිය ඊට පිළිතුරු සැපයීමට උපදෙස් ද සහිතව මා වෙත ලබා දී ඇත.

2. ඔබගේ ලිපියේ 1, 3, 4, 5 සහ 6 ඡේදවල සඳහන් කරුණු ඒ ආකාරයෙන්ම නොදන්නා බැවින් හා එම කරුණු හුදෙක් ඔබගේ සේවාදායකයාගේ දැනුමට සීමා වී ඇති බැවින් එම කරුණු එහි සඳහන් කර ඇති ආකාරයෙන්ම පිළිනොගන්නා බව මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර සිටියි.

3. ඔබගේ ලිපියේ 2 වන ඡේදය පිළිගනියි.

4. ඔබගේ ලිපියේ 7 වන ඡේදයේ අසත්‍ය කරුණු සඳහන් කර ඇති බැවින් ප්‍රතික්ෂේප කර සිටියි.

5. ඔබගේ ලිපියේ 8 වන ඡේදයේ සඳහන් ඇතැම් කරුණු තාක්ෂණික කරුණු බැවින් ද, ඔබගේ සේවාදායකයාගේ දැනුමට පමණක් සීමා වී තිබෙන ඒවා බැවින් ද, එම ඡේදයේ සඳහන් කරුණු එහි ලියා ඇති ආකාරයෙන්ම මාගේ සේවාදායකයා විසින් පිළිනොගනී.

6. ඔබගේ ලිපියේ 9 වන ඡේදයේ සඳහන් කාරිගේ චැනල් එක යන යූටියුබ් නාලිකාවේ මිනිස් ජීවිත බිලිගත් ඉන්දියානු බෙහෙත් ගෙන්වන මාලිමාවේ ගජමිතුරා, නගරාධිපති බැල්තසාර්ගේ මස්සිනා, ඇමති නලින්ද හංගපු කතාව යන ශීර්ෂය රැගත් වැඩසටහනක් කළ බව පමණක් මාගේ සේවාදායකයා විසින් පිළිගනියි.

7. ඔබගේ ලිපියේ 10 වන ඡේදයේ කරුණු අතිශෝක්තියෙන් සඳහන් කර තිබෙන බව කියා සිටින අතර, වාර්තා වී තිබෙන නැරඹීම් වාර ගණනය කිරීමේ දී එම අගය සාපේක්ෂ වශයෙන් අවම ප්‍රමාණයක් බව කියා සිටියි.

8. 11 වන ඡේදයේ සඳහන් කරුණුවලට පිළිතුරු වශයෙන් මා වෙත උපදෙස් ලැබී ඇත්තේ යට දැක්වෙන පරිදිය. එනම්,-

a. ඔබගේ සේවාදායකයා විසින් ම මින් පෙර අවස්ථාවල දී ප්‍රසිද්ධියේ හා/හෝ ජනමාධ්‍ය වෙත අදහස් දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හා/හෝ එම අමාත්‍යාංශය මැදිහත්ව ගෙන්වන ඖෂධ හා ඒවායේ ප්‍රමිතිය සම්බන්ධයෙන් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයා සෘජුව වගකිව යුතු බවයි. එම පිළිගැනීම අනුව මාගේ සේවාදායකයා විසින් ඉහත කී වැඩසටහනේදී ප්‍රකාශ කරන ලද එකී කරුණ සත්‍යයකි.

b. ඖෂධ ගෙන්වූ සමාගම සමග ඔබගේ සේවාදායකයා වංක සහයෝගයකින් කටයුතු කර තිබෙන බවක් මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර නොමැත. එහෙත් ඔබගේ සේවාදායකයා විසින් අදාළ ඖෂධය ගෙන්වන ලද සමාගම වන්නේ පී.ටී.සී. මෙඩිකල්ස් ප්‍රයිවෙට් ලිමිටඩ් යන සමාගම බව චේතාන්විතව යටපත් කරමින් අදාළ පුවත්පත් සාකච්ඡාව සිදු කර ඇත. එම කරුණ ඔබගේ සේවාදායකයා විසින් ඊළඟ සතියේ 2025.12.23 දින පවත්වන ලද කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාවේ දී පිළිගෙන ඇත. එසේ අදාළ සමාගම පිළිබඳ කරුණු මාගේ සේවාදායකයා විසින් හෙළිදරව් කරන තෙක් ජනතාවගෙන් වසන් කිරීමට හේතුකාරක වන සාධක ඔබගේ සේවාදායකයා විසින් මෙතෙක් ප්‍රකාශ කර නැත.

c. ඔබගේ සේවාදායකයා අදාළ ඖෂධය පිළිබඳ ප්‍රශ්නය යටපත් කිරීමට උත්සාහ කරන බවක් ඒ ආකාරයෙන්ම මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර නැත. එහෙත් ඔබගේ සේවාදායකයා විසින්ම පසුව 2025.12.23 දින පවත්වන ලද කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාවේ දී සෘජුව හා ව්‍යංගව පිළිගෙන ඇති කරුණු අනුව ඔබගේ සේවාදායකයා විසින් අදාල ප්‍රශ්නය පිළිබඳ සත්‍ය කරුණු යටපත් කිරීමට උත්සාහ කර තිබෙන බව තහවුරු වී ඇත.

d. ඔබගේ සේවාදායකයා ජනතාව පිළිබඳ හැඟීමක් නැති නිර්දය පුද්ගලයකු බවට මාගේ සේවාදායකයා විසින් අර්ථ ගන්වා නොමැත. එහෙත් බාල ඖෂධ හේතුවෙන් මියගිය රෝගීන් සම්බන්ධයෙන් ඔබගේ සේවාදායකයා විසින් ප්‍රතිචාර දැක්වූ ආකාරය හා විලාසය සම්බන්ධයෙන් ජනමාධ්‍ය ඔස්සේ දිස් වූ ආකාරය පිළිබඳව මාගේ සේවාදායකයාගේ නිරීක්ෂණය සාමාන්‍ය පුද්ගලයකුගේ ඇසින් කෙටියෙන් විස්තර කර ඇත. එසේම අදාළ මරණ සම්බන්ධයෙන් නිල වශයෙන් තම වගකීම් ප්‍රකාරව අවම තරමින් තම ශෝකය හෝ පළ කර නොසිටීම මත පදනම්ව සාමාන්‍ය පුරවැසියකුගේ හැඟීම මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර ඇති අතර එසේ කණගාටුව ප්‍රකාශ කිරීම ඔබගේ සේවාදායකයා විසින් එදින සිදු කළ යුතුව තිබුණි.එහෙත් ඔබගේ සේවාදායකයා විසින් එසේ සිදු කිරීම පැහැර හැර තිබෙන බව සෘජුව හා/හෝ ව්‍යංගව පිළිගනිමින් 2025.12.23 දින පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාවේ දී එම මරණ සම්බන්ධයෙන් තම ශෝකය පළ කර ඇත.



CamScanner

9. ඔබගේ ලිපියේ 12 වන ඡේදයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කිරීමට යැයි මට උපදෙස් ලැබී ඇති අතර බාල බෙහෙත් ලබා දීම හේතුවෙන් රෝගීන් මරණයට පත් වීම සම්බන්ධයෙන් 2025.12.16 දින කැබිනට් මණ්ඩල තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාවේ දී ජනතාවට කරුණු දැක්වීමේ දී වැදගත් කරුණු මහජනතාවට හෙළි කිරීමෙන් වැළකී සිටීම මඟින් හා නිවැරැදි තොරතුරු විකෘති වී සන්නිවේදනය වන ලෙස තම කරුණු දැක්වීම මඟින් ජනතාවගේ විධායක බලයේ භාරකරුවකු ලෙස එම බලය ජනතාවගේ යහපත පිණිස පාවිච්චි කිරීමට බැඳී සිටින සෞඛ්‍ය අමාත්‍යවරයා වන ඔබගේ සේවාදායකයා විසින් ජනතාව විෂයෙහි ඉටු කළ යුතු ව්‍යවස්ථාපිත යුතුකම් ඉටු කිරීම පැහැර හැරීම සිදු කර ඇති බවත් ඒ බව දැනගැනීමට පරමාධිපත්‍ය බලය හිමි ජනතාවට අයිතිය ඇති බවත් මාධ්‍යකරුවකු ලෙස ඔබගේ සේවාදායකයා විසින් සත්භාවයෙන් කටයුතු කළේ නම් එසේ හෙළි කළ යුතු වූ නිවැරදි තොරතුරු සම්බන්ධයෙන් අනාවරණයක් තම වැඩසටහනේදී ප්‍රකාශ කර ඇති බවත් එම හෙළි කිරීම කිසිසේත් අපහාසාත්මක ප්‍රකාශයක් ලෙස අර්ථ ගැන්විය නොහැකි බවත් මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර සිටියි.

10. ඔබගේ ලිපියේ 13 වන ඡේදයේ සඳහන් කරුණු අතුරින් එහි සඳහන් වෙබ් සබැඳිය හා වැඩසටහනෙන් උපුටාගන්නා ලද වාක්‍ය ඛණ්ඩ පමණක් පිළිගන්නා අතර ඒවායේ අන්තර්ගතය මඟින් ජනතා නියෝජිතයකු, සෞඛ්‍ය ඇමැති, කැබිනට් මණ්ඩල සාමාජික සහ කැබිනට් ප්‍රකාශක යනාදි වශයෙන් ජනතාවගේ පරමාධිපත්‍ය බලය භාර කර තිබෙන හා එකී බලය සත්භාවයෙන් ජනතාව වෙනුවෙන් පාවිච්චි කිරීමට බැඳී සිටින, ජනතාවට හා පාර්ලිමේන්තුවට වගවිය යුතු තැනැත්තකු වශයෙන් මහජනතාව වෙනුවෙන් ඉටු කළ යුතුව තිබූ යුතුකමක් පැහැර හැරීමක් හා ජනතාවට හෙළිදරව් කළ යුතුව තිබූ කරුණු විකෘති කර හෝ යටපත් කර ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් මහජනතාව වෙත කරුණු හෙළිදරව් කර සිටීම, ඔබගේ සේවාදායකයා සම්බන්ධයෙන් අපහාසාත්මක වන බවට කිසිසේත්ම නීතිය හමුවේ පිළිගත නොහැකි බවට මා වෙත උපදෙස් ලැබී තිබේ.

11. ඔබගේ ලිපියේ 14 වන ඡේදයේ සඳහන් කරුණු තරයේ ප්‍රතික්ෂේප කර සිටින මාගේ සේවාදායකයා විසින් ඔබගේ ලිපියේ 13 වන ඡේදයට පිළිතුරු වශයෙන් ඉහත 10 වන ඡේදයේ සඳහන් කරුණු නැවත වරක් කියා සිටියි. කෙසේ වෙතත් එහි සඳහන් ආකාරයේ අනියත බියක් හෝ මහජන කැළඹීමක් හෝ ඇති වූයේ නම් ඊට වගකිව යුත්තේ ඔබගේ සේවාදායකයා විසින් ජනතාව විෂයෙහි ඉටු කළ යුතු යුතුකම් ඉටු කිරීම පැහැර හැරීම කරණ කොට ගෙන පමණක් බවට මා වෙත උපදෙස් ලැබී තිබේ.

12. ඔබගේ ලිපියේ 15 හා 16 වන ඡේදවල සඳහන් කරුණු තරයේ ප්‍රතික්ෂේප කරන මාගේ සේවාදායකයා විසින් තවදුරටත් කියා සිටින්නේ ඔහුගේ වැඩසටහනේ දී ඔබගේ සේවාදායකයා සම්බන්ධයෙන් හා අදාළ පසුබිම් සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන ලද සියලු ප්‍රකාශ හා හෙළිදරව් කරන ලද සියලු කරුණු සත්‍ය බවයි. එසේම ඔබගේ සේවාදායකයාගේ කීර්තිනාමය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් එම ඡේදවල සඳහන් කරුණු හුදෙක් අතිශෝක්තියක්, කල්පිතයක් හා අසත්‍යයක් පමණක් බවත්, මාධ්‍ය හා සමාජ මාධ්‍ය ඔස්සේ ඔබගේ සේවාදායකයා සම්බන්ධයෙන් පළ වී ඇති පොදු ජනතා අදහස් හා ආකල්ප මඟින් ඒ බව මනාව සනාථ කළ හැකි බවත් මාගේ සේවාදායකයා කියා සිටියි.

13. ඔබගේ ලිපියේ 17 වන ඡේදයේ සඳහන් ආකාරයට හෝ ප්‍රමාණයට තක්සේරු කළ හැකි කිසිදු හානියක් ඔබගේ සේවාදායකයාට සිදුව නොමැති බව සඳහන් කරන මාගේ සේවාදායකයා විසින් මා හට තවදුරටත් උපදෙස් ලබා දී ඇත්තේ,

a. මාගේ සේවාදායකයා විසින් සම්පාදිත වැඩසටහනට ප්‍රස්තුත වන අදාළ 2025.12.16 දින පවත්වන ලද කැබිනට් මාධ්‍ය නිවේදන දැනුම්දීමේ රැස්වීමේ දී අදාළ ඖෂධ ඒවා මෙරටට ගෙන්වීම සම්බන්ධයෙන් ඔබගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කිරීමේ දී ඒවා සම්පූර්ණ සත්‍ය නොවන බවට හා මාගේ සේවාදායකයා විසින් හෙළිදරව් කරන ලද කරුණු තමන් විසින් වසන් කරමින් හා හෙළිදරව් නොකරමින් අදාළ ප්‍රකාශය කරන බවට ඔබගේ සේවාදායකයා හොඳාකාරම දැන සිටි බවත්,

b. ඔබ වෙත එන්තරවාසි ලිපියක් මාගේ සේවාදායකයා වෙත එවීමට උපදෙස් ලබා දීමේ දී මාගේ සේවාදායකයා විසින් තම වැඩසටහනේ දී ප්‍රකාශ කරන ලද සිද්ධිමය කරුණු හා විස්තර නිවැරැදි බවට ඔබගේ සේවාදායකයා විසින් හොඳාකාරව දැන සිටි බවත් හා එසේ දැන දැනම අසත්‍ය පදනමක් මත පිහිටා එන්තරවාසියක් මාගේ සේවාදායකයා වෙත එවීමට ඔබ වෙත උපදෙස් ලබා දී ඇත්තේ අසත්භාවයෙන් හා ද්වේශසහගත ලෙස බවත්,

c. එසේම මාගේ සේවාදායකයා විසින් තම  වැඩසහනින් මතු කරන ලද කරුණුම පදනම් කරගෙන 2025.12.23 දින පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී ජනමාධ්‍යවේදීන් විසින් ඔබගේ සේවාදායකයාගෙන් ප්‍රශ්න කිරීමේ දී මාගේ සේවාදායකයාගේ වැඩසටහනේ අන්තර්ගත කර තිබූ ඔබගේ සේවාදායකයා විසින් අසත්‍ය බවට කියන කරුණු මොනවාද යන්න නිශ්චිතව හෙළිදරව් කර නොමැති බවත්, එසේ නොකර මාගේ සේවාදායකයා වෙත එන්තරවාසියක් යවන බවට පමණක් මාධ්‍ය හමුවේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද බවත්, එහි දී ඔබගේ සේවාදායකයා විසින් මාධ්‍ය ඉදිරියේ මෙහි පහත සඳහන් වචන හා වාක්‍ය භාවිත කර ඇති බවත් ය. එනම්,

> ...ඔබ කියපු කෙනාට මම කියන්න කැමැතියි වැරැදි තොරතුරු මත වැරැදි මතයක් සමාජගත කරන්න හදනවා දැන් ඔහුට තිබෙන්නේ ඒ තොතුරුවල හරි මූලාශ්‍ර හොයා ගෙන යන එක .කොහොමත් තව දවස් දෙක තුනකින් ඔහුට අදාළ කරන ලෙටර් ඔෆ් ඩිමාන්ඩ් එක හම්බ වෙයි.

14. ඔබගේ ප්‍රකාශය තුළ ‘ඔබ කියපු කෙනාට‘ යන වචන මඟින් පැහැදිලිවම මාගේ සේවාදායකයාව අදහස් කර ඇති බව හා ඔබගේ සේවාදායකයාගේ ඉහත කී වචන හා වාක්‍ය මඟින් සිදු කරන ලද ප්‍රකාශය මාගේ සේවාදායකයා සම්බන්ධයෙන් සිදු කරන බව එම වැඩසටහන බලා සිටි හා ඊට සවන් යොමු කරන ලද ඕනෑම ප්‍රේක්ෂකයකුට හා/හෝ අසන්නකුට පහසුවෙන්ම වැටහෙනු ඇත.

15. කෙසේ වෙතත් ඔබට ඔබගේ සේවාදායකයා විසින් කිසි විටෙක මාගේ සේවාදායකයා විසින් වැරදි තොරතුරු මත වැරදි මතයක් සමාජගත කරන්නට උත්සාහ කරන බවට හෝ එම අර්ථය ඇති කිසි ක්‍රියාවක් මාගේ සේවාදායකයා විසින් සිදු කරන ලද බවට කිසිදු උපදෙසක් ලබා නොදීමෙන් ම පෙනී යන්නේ ඔබගේ සේවාදායකයා විසින් 2025.12.23 දින මාධ්‍ය හමුවේ සිදු කරන ලද

ප්‍රකාශයත්, ඔබ හට මාගේ සේවාදායකයාට එන්තරවාසියක් එවීම සඳහා උපදෙස් ලබා දීමත් සිදු කර තිබෙන්නේ හුදෙක් සත්භාවයකින් හා හරවත් පදනමකින් තොරව හා තමන් විසින් සාවද්‍ය ප්‍රකාශයන් හා උපදෙස් ලබා දෙන බවට දනිමින්ම හා මාගේ සේවාදායකයා විෂයෙහි ඇති කර ගත් ද්වේශය මත පදනම්ව බවය.

16. මාගේ සේවාදායකයා විසින් මා හට උපදෙස් ලබා දී ඇත්තේ මාගේ සේවාදායකයා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරියකු සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලේඛකත්ව සහ සන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමාලාභියකු ද වන ඔහු එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ලේක්හවුස්) කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධූරය ද, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ධූරය ද, ඇතුළුව වගකිව යුතු තනතුරු දැරූ අයකු බවත්, 1991 – 1993 කාලයේ දී 'ලක්දිව 'පුවත්පතේ ප්‍රවෘත්ති කර්තෘ ලෙසද, 'ලංකා ඉරිදා සංග්‍රහයේ' ආරම්භක සම කර්තෘ හා මෙහෙයුම් කර්තෘ වශයෙන්ද, 'හෙළදිව' පුවත්පතේ ප්‍රධාන කර්තෘ වශයෙන් ද, ටෙලිවිෂන් වැඩසටහන් ඉදිරිපත් කරන්නකු හා මෙහෙයවන්නකු වශයෙන් ද කටයුතු කර ඇති බවත් උපාධි අපේක්ෂක හා උසස් පෙළ සිසුන් වෙනුවෙන් 'සිංහල භාෂාව' දේශකවරයකු ලෙස කටයුතු කර ඇති බවත් සිංහල භාෂාව පිළිබඳ සහ ගවේෂණාත්මක ග්‍රන්ථ රචනා කළ ලේඛකයකු බවත් ශ්‍රී ලංකාවේ ජනප්‍රිය යූටියුබ් නාලිකාවක් වන 'කාරිගෙ චැනල් එක'හි නිර්මාතෘ හා මෙහෙයවන්නාද වන අතර ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ තනතුරු හා වගකීම් දරා ඇති ජනතාව අතර ප්‍රසිද්ධත්වයක් හා විශ්වාසයක් අත් කර ගත් තැනැත්තකු බවයි.

17. එසේ තිබිය දී, ඔබ විසින් ප්‍රසිද්ධියේ ඉහත වචන භාවිත කිරීමෙන් සිදු කරන ලද ප්‍රකාශය මඟින් හා/හෝ එහි බලපෑම හේතුවෙන් (වෙනත් දෑ අතර) මාගේ සේවාදායකයා විශ්වාසය තැබිය නොහැකි අයකු බවට ඔබගේ සේවාදායකයා විසින් ජනතාවට ප්‍රකාශ කරන ලද බවත්, එමඟින් ඔබගේ සේවාදායකයා විසින් ප්‍රසිද්ධියේ මාගේ සේවාදායකයාගේ ගරුත්වයට හා කීර්තියට හානි කර එමඟින් මාගේ සේවාදායකයාට අපහාසයක් සිදු කර තිබෙන බව මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර සිටියි.

18. එසේ හෙයින් ඔබගේ සේවාදායකයා විසින් 2025.12.23 දින පැවැති කැබිනට් මණ්ඩල තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේ දී මාගේ සේවාදායකයා සම්බන්ධව ඉහත සඳහන් වාක්‍ය හා වචන භාවිත කරමින් සිදු කරන ලද ප්‍රකාශය මඟින් මා සේවාදායකයාට සිදු කරන තිබෙන අපහාසය හේතුවෙන් මාගේ සේවාදායකාට සිදුව තිබෙන හානිය රුපියල් බිලියන දෙකකට (රු 2,000,000,000) තක්සේරු කර සිටින බවත්, එම මුදල ඔබගේ සේවාදායකයාගෙන් ඉල්ලා සිටින බවත් දන්වා සිටීමට යැයි මා වෙත උපදෙස් ලැබී ඇත.

19. ඔබගේ ලිපියේ 18 වන ඡේදයේ සඳහන් කරුණු තරයේ ප්‍රතික්ෂේප කරන මාගේ සේවාදායකයා විසින් ප්‍රකාශ කර සිටින්නේ,

   a. පෙර සඳහන් පරිදි මහජනතාවගේ පරමාධිපත්‍ය බලය භාරකර ක්‍රියාත්මක කරන මහජන නියෝජිතයකු හා විධායකය මෙහෙයවන අමාත්‍යවරයකු වශයෙන් ඔබගේ සේවාදායකයා තම තනතුරේ සිටිමින් කරනු ලබන ජනතාවට බලපාන කාර්යයන් සම්බන්ධයෙන් දැන ගැනීමට ජනතාවට අයිතියක් තිබෙන බවත්,



CS CamScanner

b. ඔබගේ සේවාදායකයා සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටිය දී ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ඖෂධ සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තත්ත්වයෙන් ඔබගේ සේවාදායකයා වගකීමෙන් බැඳී සිටින බව ඔබගේ සේවාදායකයා විසින්ම පිළිගෙන තිබිය දී හා එසේ ගෙන්වන ලද ඖෂධ හේතුවෙන් රජයේ රෝහල්වල රෝගීන් මියයෑමේ දී ඊට හේතූන් හා පසුබිම් වන හේතූන් දැන ගැනීමේ අයිතියක් ජනතාවට ඇති බවත්, එකී හේතූන් පිළිබඳ සත්භාවයෙන් යුතුව අනාවරණය කිරීමේ යුතුකමක් ඔබගේ සේවාදායකයාට ද ඇති බවත්,

c. තවද, ඉහත සිද්ධියට අදාළ හා ඊට පසුබිම් වන සිද්ධි හා කරුණු සම්බන්ධයෙන් ජනතාවට දැනුම්දීමට හා අදාළ ඖෂධ ගෙන්වීමට වගකිවයුතු අමාත්‍යවරයා විසින් සත්භාවයෙන් යුතුව එම සිද්ධියට අදාළ සම්පූර්ණ කරුණු නිවැරැදිව හෙළිදරව් කර නොමැති අවස්ථාවේ දී ඔබගේ සේවාදායකයාගේ එකී ක්‍රියාව හා නොකරහැරීම සම්බන්ධයෙන් ජනතාවට කරුණු හෙළිදරව් කිරීමේ යුතුකමක් මාධ්‍යකරුවකු ලෙස මාගේ සේවාදායකයාට තිබෙන බවත්,

d. එබැවින් මාගේ සේවාදායකයා විසින් සම්පාදිත ඔබගේ ලිපියේ සඳහන් ප්‍රකාශ ඇතුළත් වැඩසටහන හා එම ප්‍රකාශ මහජන සුබසිද්ධිය පිණිස මාගේ සේවාදායකයා විසින් සකස් කර, ප්‍රකාශ කර ප්‍රසිද්ධ කරන ලද බවත්,

e. මාගේ සේවාදායකයාගේ එම වැඩසටහන මහජන සුබසිද්ධිය පිණිස හා මහජනාව විසින් අත්‍යවශයෙන්ම දැනගත යුතු කරුණු සම්බන්ධයෙන් සකස්ව තිබූ බව 2025.12.23 දින පැවැති මාධ්‍ය හමුවේදී වෙනත් මාධ්‍යකරුවන් විසින් මාගේ සේවාදායකයාගේ වැඩසටහනේදී මතු කර තිබූ කාරණා ඔබගේ සේවාදායකයාගෙන් විමසීම මඟින්ද, එම ප්‍රශ්න කිරීමේදී ඒවාට ඔබගේ සේවාදායකයා විසින් මාගේ සේවාදායකයා විසින් මතුකරන ලද කරුණු පදනම් කර ගෙන හා මාගේ සේවාදායකයා විසින් මතු කරන ලද අඩුපාඩු හා නොකර හැරීම් නිවැරැදි කරමින් හා පරිපූර්ණත්වයට පත් කරමින් පිළිතුරු දීම මඟින් ද, තවදුරටත් සනාථ වන බවත්,

f. එසේ හෙයින් අදාළ වැඩසටහන අන්තර්ජාලයේ මහජනතාවට ප්‍රවේශ වීමට හැකි වන පරිදි තැබීමට සාධාරණ හා යුක්ති සහගත හේතූන් පවතින බවත් හා එම වැඩසටහන අන්තර්ජාලයෙන් ඉවත් කිරීම ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීමක් වන බවත්, ඔබ වෙත දන්වා සිටීමට යැයි මා වෙත උපදෙස් ලැබී ඇත.

20. ඔබගේ ලිපියේ 19 හා 20 ඡේදවල සඳහන් කරුණු එක්ව හා වෙන් වෙන්ව ප්‍රතික්ෂේප කරන මාගේ සේවාදායකයා විසින් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ මාගේ සේවාදායකයාට එරෙහිව නඩු පැවරීමට හෝ අතුරු ඉන්ජන්ෂන් තහනමක් ලබා ගැනීමට හෝ ඔබගේ සේවාදායකයාට කිසිදු අයිතියක් නොමැති බවයි.

21. තවදුරටත් මා වෙත උපදෙස් ලැබී ඇත්තේ,



CS CamScanner

a. මාගේ සේවාදායකයාගේ වැඩසටහන තුළ මහජනතාවගේ අවධානයට යොමු කර තිබෙන්නේ තත්කාලීන සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියාවන් මිස නලින්ද ජයතිස්ස යන පුද්ගලයාගේ ක්‍රියාවන් නොවන බවටත්,

b. මාගේ සේවාදායකයාගේ වැඩසටහනෙහි අන්තර්ගත කර තිබෙන්නේ ඔබගේ සේවාදායකයාගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත කරුණු දැක්වීමක් පමණක් බවත්,

c. එකී කරුණු විශ්ලේෂණාත්මකව දැක්වීමට හා අදාළ කරුණු හා සිද්ධීන් පිළිබඳ විස්තර ඒ ආකාරයෙන්ම දැන ගැනීමට අයිතියක් ජනතාවට තිබෙන බවත් එබැවින් එම කරුණු මහජන සුබසිද්ධිය පිණිස එම වැඩසටහනේ අන්තර්ගත කොට ප්‍රචාරය කරන ලද බවත්,

d. එම වැඩසටහනේ කිසිදු ප්‍රකාශයක් හෝ ප්‍රකාශයක ඛණ්ඩයක් හෝ ද්වේශසහගතව සිදු කර නොමැති බවත් හුදෙක් තොරතුරු දැනගැනීමෙ මහජන අයිතිවාසිකමකට අදාළව සත්භාවයෙන් යුතුව එකී ප්‍රකාශයන් එම වැඩසටහනට ඇතුළත් කර තිබෙන බවත්,

e. මාගේ සේවාදායකයාගේ වැඩසටහනේ ප්‍රචාරය වූ කරුණු සත්‍ය බවත්, මාගේ සේවාදායකයා විසින් සිදු කරන්නට යෙදුණු බවට ඔබ ලිපියේ සඳහන් කර තිබෙන ප්‍රකාශ අසත්‍ය බව හා එසේ අසත්‍ය වීමට හේතූන් කවරේද යන්න පිළිබඳව ඔබගේ ලිපියේ නිශ්චිතව සඳහන් කර නොමැති බවත්, ඔබගේ සේවාදායකයා වෙත දන්වා සිටීමට වේ.

22. කරුණු එසේ හෙයින් ඉහත කී රුපියල් බිලියන දෙකක (2,000,000,000) මුදල මාගේ සේවාදායකයා වෙත ගෙවන ලෙස ඔබ මඟින් ඔබ විසින් නියෝජනය වන ඔබගේ සේවාදායකයාගෙන් ඉල්ලා සිටින අතර එම මුදල මෙම ලිපිය ලැබී දින 14ක් ඇතුළත ගෙවීමට ඔබගේ සේවාදායකයා අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් එකී මුදල ඔබගේ සේවාදායකයාගෙන් අය කර ගැනීමට නඩු පැවරීමට යැයි මා වෙත තවදුරටත් උපදෙස් ලැබී ඇති බව මෙයින් දන්වා සිටිමි.

23. එසේම ඔබගේ ලිපියේ සඳහන් කුමන හෝ කරුණක් මත ඔබ විසින් මාගේ සේවාදායකයාට එරෙහිව නඩු පවරනු ලැබුවහොත් එම නඩුවට විත්තිවාචික ඉදිරිපත් කර හබ කරන ලෙසත් එහි දී මාගේ සේවාදායකයාගේ නීතිමය අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන ලෙසත් මා වෙත තවදුරටත් උපදෙස් ලැබී තිබේ.

ස්තුතියි,
මීට,

නීතිඥ සවනි රාජකරුණා

Sawani Rajakaruna
Attorney-at-Law, Notary Public &
Commissioner for Oaths
Supreme Court Reg. No: A28949
No.365, Rajagiriya Road, Rajagiriya, Sri Lanka.
Tel: 0711 911 711, 0755 955 375
Email: rajakaruna.sawani@gmail.com



CamScanner